# දැන්වීමයි

## සියළුම පීඨයන්හි සිසුන් වෙත

**2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා නේවාසික පහසුකම් ලබාදීම**
**(දෙවන වසර, තෙවන වසර, සිව්වන වසර සහ අවසන් වසර)**

2022/2023 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් නේවාසික පහසුකම් අවශ්‍ය සිසුන් සඳහා 2023.10.09 දින සිට නේවාසිකාගාර අයදුම්පත් නිකුත් කරනු ලැබේ. නේවාසික පහසුකම් අවශ්‍ය සිසුන් https://welfare.sjp.ac.lk/downloads/ වෙබ් අඩවිය හරහා අයදුම්පත ලබාගෙන එය නිසි ලෙස සම්පූර්ණ කර 2023.11.09 දිනට පෙර ශිෂ්‍ය සුභසාධක අංශයේ තබා ඇති පොතෙහි භාරදුන් බවට අත්සන් කොට භාරදිය යුතුවේ.

සැ.යු.

1. නේවාසිකාගාරයන්හි පවතින්නේ සීමිත ඉඩපහසුකම් ප්‍රමාණයක් පමණක් වන බැවින් නේවාසිකාගාර පහසුකම් ලබාදීම ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හරහා සිදුවේ.
2. **දෙවන, තෙවන හා සිව්වන වසර (වෛද්‍ය විද්‍යා) නේවාසිකාගාර අයදුම්පත් ප්‍රාදේශිය ලේකම් හා ග්‍රාමසේවක මගින් සහතික කර තිබිය යුතු අතර පළමු හා අවසන් වසර අයදුම්පත් ග්‍රාමසේවක මගින් පමණක් සහතික කර තිබීම ප්‍රමාණවත් වේ. එසේ සහතික නොකරන ලද අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
3. ඔබ සමෘද්ධි ලාභී පවුලක ශිෂ්‍යයෙක් / ශිෂ්‍යාවක් නම් අදාල සමෘද්ධි සහතිකය තම ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරිගෙන් හා ප්‍රාදේශීය ලේකම් මගින් සහතික කර තිබිය යුතුය.
4. වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේ නම් අදාල වෛද්‍ය වාර්තාව රජයේ වෛද්‍යවරයෙකු මගින් සහතික කර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වෛද්‍ය නිළධාරීතුමිය/තුමා මගින් සහතික කර තිබිය යුතුවේ.
5. සියළුම අයදුම්කරුවන් විසින් ශිෂ්‍ය සුභසාධක අංශයෙහි තබා ඇති පොතෙහි අදාල අයදුම්පත් බාරදුන් බවට සටහන් කල යුතුය.
6. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කවර හේතුවක් මත හෝ බාරනොගන්නා අතර අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. අයදුම්පත් ඉදිරිපත් නොකරන කිසිම ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට නේවාසිකාගාර පහසුකම් ලබානොදෙන බව කරුණාවෙන් සලකන්න.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
ශිෂ්‍ය සුභසාධක අංශය
2023.10.06